# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2007 ජූනි මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2007 ජූනි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 7.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි

## 2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 ජුනි මස 21 වන දින]

එල්.ඩී.—ඕ.අයි.එන්.සී. 4/2005

### ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක්, එකී ආයතනයේ මෙතෙක් බලාත්මකව පැවති රීති අනුව එකී ආයතනයට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද; පූර්විකාව.

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී ආයතනය විසින් මෙතෙක් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන් ගේ ආයතනයේ දැනට අධි සාමාජිකයන්ව හා ආශ්‍රිත සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව පිහිටුවීමේ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ප්‍රමාණ සමීක්ෂක වෘත්තියේ අර්ථ සිද්ධිය, තත්ත්වය, සුභ සාධනය, අයිතිවාසිකම් සහ වරප්‍රසාද සහ ප්‍රමාණ සමීක්ෂක වෘත්තියට අදාළව මහජනයාගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ආ) ප්‍රමාණ සමීක්ෂක වෘත්තියට අදාළ වන කාරණාවල දී රාජ්‍ය අධිකාරීන්ට උපදෙස් දීම සහ අදහස් හුවමාරු කර ගැනීම ;

(ඇ) සංස්ථාව වෙත යොමු කරනු ලබන ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ආරාවුල් සමථයකට පත් කිරීම ;

(ඈ) ප්‍රමාණ සමීක්ෂණය සහ ඊට අදාළ විෂය දැනුම පුළුල් කිරීමේ අරමුණින් දේශණ සහ සාකච්ඡා සංවිධානය කිරීම, පොත් සහ වෙනත් ලිපිලේඛන පළ කිරීම ;

(ඉ) ප්‍රමාණ සමීක්ෂණයට අදාළ නීතිය හා පරිචය අධ්‍යයනය කිරීමට දිරි දීම ;

(ඊ) ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ ලා අත්කර ගනු ලබන ජයග්‍රහණ සඳහා ප්‍රදාන සහ ත්‍යාග ඇති කිරීම හා පිරිනැමීම ;

(උ) සංස්ථාවේ සාමාජිකත්වයට සාමාජිකයන් ඇතුළත් කර ගැනීම පිළිබඳ සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සහ ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුවීම් කිරීමට අපේක්ෂා කරන තැනැත්තන් පුහුණු කිරීම, විධිමත් කිරීම, සංස්ථාවේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට අවශ්‍ය අධ්‍යයන පාඨමාලා නියම කිරීම සහ අනුමත කිරීම, එවැනි පාඨමාලා හෝ විභාග පැවැත්වීම සඳහා කටයුතු යෙදීම සහ ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා වූ පිළිගත් අධ්‍යාපනික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඌ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ද, සංස්ථාවේ සාමාජිකයන්ගේ වෘත්තීය චර්යාවට අදාළ ප්‍රමිති ද නියම කිරීම සහ ඒවාට අනුකූලව කටයුතු කරනු ලබන බවට වගබලා ගැනීම.

4. මේ පනතේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, පහත දැක්වෙන දෑ කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය :— සංස්ථාවේ බලතල.

(අ) පුස්තකාලයක් සහ සිතියම් එකතුවක්, ආදර්ශ සිතුවම්, සැලසුම් නිර්මාණ හා වෙනත් ද්‍රව්‍ය එකතුවක් පිහිටුවීම සහ ඒවා නඩත්තු කිරීම, ව්‍යාප්ත කිරීම හා වැඩි දියුණු කිරීම ;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම ;

(ඇ) ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ තොරතුරු ප්‍රචාරණය කිරීම සඳහා වාර සහරා, ලිපි ලේඛන, පොත් සහ වාර ප්‍රකාශන පළ කිරීම;

(ඈ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයන් හි වෙනත් තැනැත්තන්, නියෝජ්‍යායතන සහ සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම, ඔවුන්ට සහාය දීම, ඔවුන්ගේ සහාය ලබා ගැනීම සහ ඔවුන් සමග සම්බන්ධතා වර්ධනය කර ගැනීම ;

(ඉ) යම් ත්‍යාගයක්, පරිත්‍යාගයක් හෝ රික්තවරණයක් පිළිගැනීම හා එබඳු කවර හෝ ත්‍යාගයකට, පරිත්‍යාගයකට හෝ රික්තවරණයකට සම්බන්ධ කවර හෝ විශ්වාස භාරයක් ඉටු කිරීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නියම කිරීම ;

(උ) සංස්ථාවේ පරමාර්ථ සඳහා අවශ්‍ය වන යම් මුදලක්, සංස්ථාව සුදුසු යයි සිතන ආකාරයේ කොන්දේසි හා ඇප මත ණයට ගැනීම ;

(ඌ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, භාර ඇති කිරීම සහ පරිපාලනය කිරීම සහ යම් බැංකුවක ජංගම තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ හෝ ඒවායින් කවර හෝ පරමාර්ථයක් ඉටු කර ගැනීමට ආනුෂංගික වන හෝ හිතකර වන නීත්‍යානුකූල දෑ සියල්ල කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**5**. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම, හා පරිපාලනය කිරීම, මේ පනතේ 7 වන වගන්තියේ විධිවිධානවලට අනුව සාදනු ලබන සංස්ථාවේ රීතිවලට අනුකූලව පත්කරනු ලබන හෝ තෝරා පත්කර ගනු ලබන නිලධරයන්ගෙන් හා වෙනත් සාමාජිකයන්ගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට හා සාදනු ලබන රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතු ව ම වූ දිනයේ දී ආයතනයේ පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන්ගෙන් සංස්ථාවේ ප්‍රථම සභාව සමන්විත විය යුතු ය.

සාමාජික නාමලේඛනය

**6**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ සාමාජිකයකු වූ හැම තැනැත්තකු ගේ ම හා ඉන් පසු ව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කරනු ලැබිය යුතු, සාමාජික නාම ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ රීති.

**7**. (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණි ඡන්දය දෙන සාමාජිකයන් අතුරෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියළු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, සාමාජිකයන් ඇතුළත් කර ගැනීමේ දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම ;

(ආ) සභාවේ සංයුතිය හා සභාව තෝරා පත් කරගැනීම, ධුර කාලය, සභාවේ සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම්, ධුරයෙන් ඉවත් කිරීම් හෝ ධුර අත් හැරීම් සහ සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම්, පාරිශ්‍රමික හා සේවයෙන් පහ කිරීම්, සේවය අවසන් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ හෝ සභාවේ හෝ යම් අනුකාරක සභාවක හෝ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් කැඳවීම, පැවැත්වීම, ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු ;

(ඉ) සභාවේ හා සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ වගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම එම රීති සංශෝධනය කිරීම, වෙනස් කිරීම හා ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සෑම සාමාජිකයකු ම මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ පසුව සංස්ථාව විසින් කලින්කල සාදනු ලබන රීතිවලට යටත් විය යුතු ය.

8. මේ පනත යටතේ සංස්ථාව විසින් අත්කර ගනු ලබන හෝ දරනු ලබන සියලු ම චංචල, නිශ්චල දේපළ හා සංස්ථාවට ලැබෙන හා සංස්ථාවට ගෙවනු ලබන සියලු මුදල් සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත් ව දැරීම, භාවිත කිරීම හා යෙදවීම ද කළ යුතු ය. සංස්ථාවේ දේපළ.

සංස්ථාවේ අරමුදල

**9**. සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ ඒ වෙනුවෙන් භාරගන්නා ලද හෝ මින්මතු භාර ගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග ග්‍රාහක මුදල් හෝ දායක මුදල් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත කරනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

**10**. (1) සංස්ථාවේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් යටත් පිරිසෙයින් වර්ෂයකට වරක්වත් පරීක්ෂා කර විගණනය කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

(5) සභාවේ වාර්ෂික වාර්තාවට, එකී වර්ෂයේ අප්‍රේල් මස පළමු වන දිනෙන් ආරම්භව ඊළඟ වර්ෂයේ මාර්තු තිස් එක් වන දිනෙන් අවසන් වන මාස දොළහක කාලයක් සඳහා වන ගිණුම් වාර්තාව, ශේෂ පත්‍රය හා විගණකාධිකාරිවරයාගේ වාර්තාව ඇතුළත් විය යුතු ය.

**11**. සංස්ථාවේ මුදල් වර්ෂය, සෑම වර්ෂයක ම අප්‍රේල් මස පළමු වන දිනෙන් ආරම්භ වී ඊළඟ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය. මුදල් වර්ෂය.

**12**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ආයතනයෙහි පැවැති සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එ දිනට ආයතනයට ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් හා ගාස්තු මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. ආයතනය විසින් සහ ආයතනයට ගෙවිය යුතු ණය.

**13**. (1) මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවල නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සපුරාලන සංස්ථාවේ සෑම සාමාජිකයකුට ම "වරලත් ප්‍රමාණ සමීක්ෂක" යන අභිධානය භාවිත කිරීමට හිමිකමක් තිබිය යුතු ය. අභිධානයන් භාවිත කිරීම.

(2) අධි සාමාජිකයකු වශයෙන් ලියාපදිංචි වී ඇති, සංස්ථාවේ සෑම සාමාජිකයකුට ම, ඔහුගේ නමට පසුව, "එෆ්. අයි. කිව්. එස්. එස්. එල්." යන තනතුරෙහි කෙටි යෙදුම භාවිත කිරීමට හිමිකමක් ඇත.

(3) ආශ්‍රිත සාමාජිකයකු වශයෙන් ලියාපදිංචි වී ඇති සංස්ථාවේ සෑම සාමාජිකයකුට ම, ඔහුගේ නමට පසුව "ඒ. අයි. කිව්. එස්. එස්. එල්. " යන තනතුරෙහි කෙටි යෙදුම භාවිත කිරීමට හිමිකමක් ඇත.

(4) ප්‍රමාණ සමීක්ෂකයන්ගේ සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක හවුල්කරුවන්ගෙන් හෝ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරය, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවල, නිශ්චිතව සඳහන් කරනු ලබන සුදුසුකම් සපුරාලන්නේ නම්, එවැනි සමාගමක් හෝ ව්‍යාපාරික ආයතනයක් විසින්, සභාව වෙත, තත්කාර්යය සඳහා කරන ලද ඉල්ලීම මත, එම සමාගම හෝ ව්‍යාපාරික ආයතනයට අවස්ථාවෝචිත පරිදි "වරලත් ප්‍රමාණ සමීක්ෂක" හෝ වරලත් ප්‍රමාණ සමීක්ෂකයෝ" යන අභිධානය භාවිත කිරීමට, සභාව විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

**14**. සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි නීතිඥවරුන්, සංස්ථාවේ බැංකුකරුවන් හා යම් නියෝජිතයන් හෝ සංස්ථාවේ වෙනත් යම් තැනැත්තන් ද සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. එම පත් කිරීම් කවර හෝ අවස්ථාවක පරිච්ඡින්න කිරීමට ද සභාවට හැකි ය. නීතිඥවරුන්, බැංකුකරුවන් හා නියෝජිතයන්.

සංස්ථාවේ මුද්‍රාව.

**15**. ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු හා සභාවේ තවත් සාමාජිකයකු ද ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**16**. සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන කිසිදු මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

විසුරුවා හැරීම හෝ වසා දැමීම.

**17**. සංස්ථාව විසුරුවා හැරීම හෝ වසා දැමීම හෝ සිදු වන අවස්ථාවේ දී, එහි සියලු ණය, බැරකම් සහ වියදම් ගෙවා අවසන් කිරීමෙන් පසු යම් දේපළක් ඉතිරි වේ නම්, එබඳු දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු ය. එහෙත් සභාවේ අභිමතය අනුව, සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇත්තා වූ ද, එහි හෝ ඒවායේ හෝ රීති ප්‍රකාරව, සිය සාමාජිකයන් අතර යම් ආදායමක් හෝ දේපළක් හෝ බෙදාහැරීම තහනම් වන්නා වූ ද යම් ආයතනයකට හෝ ආයතනවලට හෝ එකී දේපළ දෙනු ලැබිය යුතු ය. එබඳු දේපළ හෝ ඉන් කවර කොටසක් හෝ මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට අනුකූලව බැහැර කළ නොහැක්කේ නම්, එබඳු දේපළ හෝ දේපළවලින් කොටසක් හෝ යම් පුණ්‍ය අරමුණකට යොදා ගනු ලැබිය යුතු ය. එකී අරමුණ, සංස්ථාවේ සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**18**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**19**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.